# ඌව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
# ஊவா மாகாண கல்வித் திணைக்களம்
# Uva Provincial Department of Education

## සමාජ විද්‍යා තරගාවලිය - 2023

| 8 ශ්‍රේණිය | කලාප මට්ටම | කාලය: පැය 1.30 යි. |
|---|---|---|

ශිෂ්‍ය/ශිෂ්‍යාවගේ නම : ..............................................................................................

පාසලේ නම : ........................................................................ පාසල් කාණ්ඩය : ................

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

- අංක 01 සිට 10 දක්වා ඇති ප්‍රශ්නවලට වඩාත් ගැළපෙන පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. පන්සිය පනස් ජාතක පොත සිංහලයට පරිවර්තනය කළ යුගය වනුයේ,
   1. අනුරාධපුර 2. මහනුවර 3. කුරුණෑගල 4. කෝට්ටේ

02. බ්‍රිතාන්‍ය පාලන යුගයේ ආරම්භ කළ පොදු සේවාවක් නොවන්නේ,
   1. ප්‍රවාහනය 2. අධ්‍යාපනය 3. බැංකු සේවාව 4. සන්නිවේදනය

03. වැවක ජලය මනා පාලනයකින් යුතුව පිටතට ගැනීම සඳහා ඉදි කරන ලද නිර්මාණයකි.
   1. සොරොව්ව 2. පිටවාන 3. රළපනාව 4. බිසෝකොටුව

04. ඔබ ප්‍රදේශයේ නීතිය හා සාමය සුරැකීම හා මහජන ආරක්ෂාව සැපයීමේ ප්‍රධාන වගකීම ඉටු කරන ආයතනය වනුයේ,
   1. ශ්‍රී ලංකා යුධ හමුදාව 2. සිවිල් ආරක්ෂක බලකාය
   3. ශ්‍රී ලංකා ගුවන් හමුදාව 4. ශ්‍රී ලංකා පොලිසිය

05. සෞරග්‍රහ මණ්ඩලයට අයත් බාහිර ග්‍රහයින් නිවැරදිව පිහිටි කාණ්ඩය වනුයේ,
   1. බුධ, පෘථිවි, සිකුරු, අඟහරු 2. සිකුරු, අඟහරු, යුරේනස්, නෙප්චූන්
   3. බ්‍රහස්පති, සෙනසුරු, යුරේනස්, නෙප්චූන් 4. සෙනසුරු, බ්‍රහස්පති, බුධ, පෘථිවි

06. අතීතයේ බානු වාපි නමින් හැඳින් වූ වැව වර්තමානයේ හඳුන්වනු ලබන්නේ,
   1. මින්නේරිය 2. හුරුළු වැව
   3. මහකනදරා වැව 4. මානන්කට්ටිය වැව

07. දකුණු ආසියා කලාපයේ සමහර රටවල් දිගු වෙරළ තීරයකින් වට වී ඇති අතර වෙරළ තීරයක් හිමි නැති රටවල් වන්නේ,
   1. නේපාලය හා බංග්ලාදේශය 2. බංග්ලාදේශය හා පකිස්ථානය
   3. පකිස්ථානය හා භූතානය 4. නේපාලය හා භූතානය

08. "ධම්මෝ හවේ රක්ඛති ධම්මචාරී" යන ආදර්ශ පාඨය අයත් වන්නේ,
   1. පොලිසියට ය. 2. සෞඛ්‍ය සේවයට ය.
   3. ගුවන් හමුදාවට ය. 4. ශ්‍රී ලංකා යුධ හමුදාවට ය.

09. යුරෝපා මහද්වීපයට අයත් රටක් වනුයේ,
   1. ශ්‍රී ලංකාව 2. ප්‍රංශය 3. මැඩගස්කරය 4. සුඩානය



CamScanner

10. භික්ෂූන් වහන්සේලාගේ ජල පරිහරණය, අලංකාරය හා පරිසරය සිසිල්ව තබා ගැනීම යන අරමුණු තුනම ඉටු කර ගැනීමට තැන වූ පොකුණකි.

1. කුට්ටම් පොකුණ
2. කුමාර පොකුණ
3. නෙළුම් පොකුණ
4. ඇත් පොකුණ

(ලකුණු 2 x 10 = 20)

- **අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවලට හිස්තැනට ගැළපෙන නිවැරදි පිළිතුර තිත් ඉර මත ලියන්න.**

11. කලා වැවේ සිට තිසා වැවට ජලය ගෙන යෑම සඳහා යෝධ ඇල ........................ රජු විසින් කරවන ලදි.

12. රජරට ශිෂ්ටාචාරයට අයත් කලාත්මක බෝධිඝරය වූ ........................ පිහිටා ඇත්තේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ය.

13. සූර්යා වටා කක්ෂ (orbit) තල ඔස්සේ ගමන් ගන්නා ගෝලාකාර වස්තූන් ........................ ලෙස හැඳින්වේ.

14. සමස්ථ පෘථිවි තලයෙන් සියයට ........................ ක භූමි ප්‍රදේශයක් දකුණු ආසියා කලාපයට අයත් වේ.

15. බෝනොවන රෝග වැළැක්වීමට අරමුණු කරගෙන ප්‍රාථමික සෞඛ්‍ය සේවා පහසුකම් සැපයීම සඳහා දිවයින පුරා ........................ පිහිටුවා ක්‍රියාත්මක කර ඇත.

(ලකුණු 2 x 5 = 10)

- **අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

16. I බුවනෙකබාහු රජතුමාගේ පාලන මධ්‍යස්ථානය කුමක් ද? ........................

17. මානව සම්පතෙහි අභිවෘද්ධිය සහ යහපැවැත්ම කෙරෙහි බලපාන ප්‍රධාන සාධකය කුමක් ද?

........................

18. අනුරාධපුර යුගයේ ගම් දහසකට එක් වෛද්‍යවරයෙකු බැගින් පත් කළ රජතුමා කවුද?

........................

19. දකුණු ආසියා කලාපයේ ඉහළම සමාජීය සංවර්ධනයක් සහිත රට කුමක් ද? ........................

20. පද්ම ස්වර නමින් උයනක් තනවා ඇති රජතුමා කවුද? ........................

(ලකුණු 2 x 5 = 10)

- **ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා ඇති "අ" සහ "ආ" යනුවෙන් තීරු දෙකක් දැක්වේ. ඒවායේ සම්බන්ධතාවය අනුව නිවැරදි අකුර ගලපා දී ඇති පිළිතුර යටින් ඉරක් අඳින්න.**

21.

| "අ" තීරය | "ආ" තීරය |
|---|---|
| 1. ථූපාරාමය | A. නිශ්ශංකමල්ල රජු |
| 2. අභයගිරිය | B. මහසෙන් රජු |
| 3. රන්කොත් වෙහෙර | C. දේවානම්පියතිස්ස රජු |
| 4. ජේතවනය | D. වළගම්බා රජු |

1. A B C D
2. C D B A
3. B A D C
4. C D A B



CamScanner

22. "අ" තීරය

1. බෞද්ධ
2. හින්දු
3. ඉස්ලාම්
4. කතෝලික

"ආ" තීරය

A. හජ්ජි උත්සවය
B. නත්තල් උත්සවය
C. වෙසක් උත්සවය
D. තෛපොංගල් උත්සවය

1. A D B C  2. C B A D  3. C D B A  4. C D A B

23. "අ" තීරය

1. මැටි කර්මාන්තය
2. මැණික් කර්මාන්තය
3. ලෝහ කර්මාන්තය
4. පේෂ කර්මාන්තය

"ආ" තීරය

A. කබර
B. කුම්බකාර
C. පෙහෙකාර
D. මණිකාර

1. B D A C  2. D A B C  3. B C D A  4. A B C D

24. "අ" තීරය

1. තෙත් කලාපයේ ගඟකි.
2. වෙළඳ කලාපයකි.
3. කාර්මික කලාපයකි.
4. වාණිජ නගරයකි.

"ආ" තීරය

A. බියගම
B. කොළඹ
C. කළු ගඟ
D. රත්මලාන

1. C A D B  2. C B D A  3. C A B D  4. C B A D

25. "අ" තීරය

1. පෘථිවිය
2. සිකුරු
3. අඟහරු
4. බ්‍රහස්පති

"ආ" තීරය

A. විශාලම ග්‍රහයා වේ.
B. නිල් ග්‍රහයා වේ.
C. රතු ග්‍රහයා වේ.
D. උදා තරුව වේ.

1. B C A D  2. B D C A  3. A B C D  4. D B A C

(ලකුණු 2 x 5 = 10)

- **අංක 26 සිට 30 දක්වා පින්තූර ආශ්‍රිත දී ඇති ප්‍රශ්න සඳහා කෙටි පිළිතුරු සපයන්න.**

**26.**



I. මෙම රූපය හඳුනාගෙන නම් කරන්න.

..........................................................................

II. මෙය තිබූ ස්ථානය නම් කරන්න.

..........................................................................



CamScanner

27.



I. මෙම පුද්ගලයා හඳුනාගෙන නම් කරන්න.

..............................................................

II. මෙතුමා සොයාගත් විශේෂ නිර්මාණය කුමක් ද?

..............................................................

28.



I. මෙම රූපය හඳුනාගෙන නම් කරන්න.

..............................................................

II. අතීතයේ දී මෙය උපයෝගී කර ගත්තේ කුමන කර්මාන්තයක් සඳහා ද?

..............................................................

29.



I. මෙම පුද්ගලයා හඳුනාගෙන නම් කරන්න.

..............................................................

II. මෙතුමාගෙන් අපට සිදු වූ වැදගත්ම සේවය කුමක් ද?

..............................................................

30.



I. මෙම රූපය හඳුනාගෙන නම් කරන්න.

..............................................................

II. මෙම සේවය මඟින් කෙරෙන කාර්යයක් සඳහන් කරන්න.

..............................................................

(ලකුණු 4 x 5 = 20)

- **අංක 31 සිට 35 දක්වා ඇති ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.**

31. ඔබව වැරදි දේවල් සඳහා යොමු කරවන, ජීවිතය අසාර්ථක වීම සඳහා යොමු කරවන අහිතකර බලවේග දෙකක් නම් කරන්න.

I. .............................. II. ..............................

32. මහ වැව් තැනීමේ දී මුහුණ දුන් අභියෝග දෙකක් ලියන්න.

I. .............................. II. ..............................

33. අතීතයේ මෙරට යකඩ නිස්සාරණය කළ බවට පැහැදිලි සාක්ෂි හමුවන ස්ථාන දෙකක් නම් කරන්න.

I. .............................. II. ..............................



CamScanner

අඟහරුගේ උප ග්‍රහයින් දෙදෙනා නම්කරන්න.

I. ........................................ II. ........................................

. අතීතයේ ශ්‍රී ලංකාව තුළ වරින් වර රාජධානි බිහිවීමට බලපෑ හේතු දෙකක් ලියන්න.

I. ........................................ II. ........................................

(ලකුණු 4 x 5 = 20)

**අංක 35 සිට 40 දක්වා පහත දී ඇති ස්ථාන ලංකා සිතියමේ ලකුණු කර නම් කරන්න.**


6. මින්නේරිය වැව

7. කලා ඔය

8. පොළොන්නරුව

9. දඹකොළ පටුන

40. කෝට්ටෙ



(ලකුණු 2 x 5 = 10)



CamScanner



LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න